

# ඒකම විසඳුම මහ මැතිවරණයයි

- මිලින්ද මොරගොඩ

**වසර 10ක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු සහ කැබිනට් අමාත්‍යවරයකු ලෙස කටයුතු කළ මිලින්ද මොරගොඩ මහතා ජාතික ජාත්‍යන්තර තලයන්හි පිළිගත් දේශපාලනඥයෙකි. දේශපාලන විචාරකයෙකි. ඔහු ජාත්‍යන්තර කටයුතු පිළිබඳ විශේෂඥයෙකි. දැනට පාත්ෆයින්ඩර් ආයතනය හරහා ජාතික ජාත්‍යන්තර ප්‍රශ්න පිළිබඳ සංවාද පැවැත්වීම සඳහා වෙහෙසෙන මොරගොඩ මහතා සමඟ අපි සාකච්ඡා කළේ මේ දිනවල රටේ හටගෙන තිබෙන දේශපාලන බල අරගලය සම්බන්ධවයි.**

**ලංකා දේශපාලන ඉතිහාසය පිරික්සූ විට වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරම්භයේ පටන්ම අවස්ථාවාදී ස්වරූපයක් පෙන්නුම් කරයි. විටින්විට බලයට පත්වූ ආණ්ඩු ඔවුන්ගේ උවමනා එපාකම් අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන සිදුකර ගැනීමට උත්සාහ දරා තිබේ. 19 වන ව්‍යවස්ථා සංශෝධනය හරහා වර්තමානයේදී මතුව ඇත්තේ එවන් අභියෝගයකි. ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යුහය තුළ පීඩනයක් තිබෙන විටකදී අපට හුරු පුරුදු දේශපාලන විසඳුම වූයේ මැතිවරණයකට යාමයි. එවිට එම පීඩනය පිට වී යයි. මෑතකාලීනව ගැටලුව වූයේ නිසි කාලවකවානුවල මැතිවරණ නොපැවැත්වීමයි. එසේ මැතිවරණ පැවැත්වූවා නම් ඇතැම්විට මෙම පීඩනය පිටවී යන්නට ඉඩ තිබිණි.**

වර්තමාන දේශපාලන අර්බුදය තුළද මහජන නියෝජිතයන් තුළින් පිටවන්නේද එම පීඩනයයි. එසේ හෙයින් ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යුහයක් තුළ මේ සඳහා එකම විසඳුම මැතිවරණයකි. මේ මොහොතේදී මෙරට කිසිදු දේශපාලන නායකයෙක් ඡන්දයක් අනවශ්‍ය බව කියා තර්ක නොකරයි. ගැටලුව වී ඇත්තේ එම මැතිවරණ පවත්වන ආකාරය, එතෙක් භාරකාර ආණ්ඩුවේ සිටින්නේ කවුද, පවත්වන කාලවකවානුව ආදිය පිළිබඳව ඒකමතික භාවයක් නොමැති වීමයි.

**ඒ අනුව මෙම ගැටලු විසඳා ගැනීමට සියලු පක්ෂ එක්වී කුඩා භාරකාර ආණ්ඩුවක් පිහිටුවා ගතයුතුය. ඒ සඳහා කවරෙක් හෝ මැදිහත්විය යුතුය. එම භාරකාර ආණ්ඩුව ක්‍රියාත්මක විය යුත්තේ මැතිවරණය දක්වා පමණි. අග්‍රාමාත්‍ය ධුරයේ ගැටලුව සැලකීමේදී පාර්ලිමේන්තුව තුළින් සැමට පිළිගත හැකි පුද්ගලයකු සොයාගැනීමට නොහැකි නම් පිටතින් පිළිගත හැකි පුද්ගලයකු ඒ සඳහා පත්කර ගතහැකිය. හිටපු අගවිනිසුරුවරයකු, වෙනත් පිළිගත හැකි පුද්ගලයකු මීට සුදුසුය. මෑතදී පාකිස්ථානයේද එසේ සිදුවිය. බංගලාදේශයේද ව්‍යවස්ථාවෙන්ම ඊට ඉඩකඩ ඇත. මෙරටද ව්‍යවස්ථාදායකයේ ජාතික ලයිස්තුව භාවිතා කරමින් ඊට සුදුසු පුද්ගලයකු පාර්ලිමේන්තු තුළට ගෙන ඒමේ හැකියාව තිබේ. එසේ පත්කර ගන්නා අග්‍රාමාත්‍යවරයා මැතිවරණය තෙක් ධුරයේ වගකීම දරමින් නිර්පාක්ෂිකව ක්‍රියා කළ යුතුවේ.**

වර්තමානය වනවිට රට තුළ විවිධ බෙදීම් තිබේ. පන්ති මට්ටමින් හා ජාති, ආගම්, පක්ෂ ලෙසින් මෙම බෙදීම් වෙයි. පවතින දේශපාලන අර්බුදය හමුවේ අතිවන පීඩනයෙන්ද මෙම බෙදීම් උග්‍රවීම විනා අඩුවීමක් සිදුනොවේ. මැතිවරණයකින් පසුව ආණ්ඩුවක් නිර්මාණය වුවද සියළු පක්ෂ, කණ්ඩායම් නායකයකයින් එක්වී රට තුළ සමගියක් නිර්මාණය කිරීමට උනන්දු විය යුතුය. එය ඉදිරියේදී සිදුකළ යුත්තකි.

වර්තමාන දේශපාලන අර්බුදයේ කොටසක් **ඇත්තේ ශ්‍රේෂ්ඨාධිකරණයේය. තවත් කොටසක් ඇත්තේ පාර්ලිමේන්තුවේය. ඉතිරිය විධායක ජනාධිපතිවරයා සතුය. මේ අනුව ගැටලු ප්‍රධාන මාවත් තුනක් ඔස්සේ සක්‍රිය වී ඇත. ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දු වැදගත්ය තීරණාත්මකය. එහෙත් පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බහුතරයෙන් පාර්ලිමේන්තු මැතිවරණයකට යාමේ හැකියාව තිබේ. එය වඩා සාධනීය සමගි සම්පන්න ක්‍රමවේදයයි. සැබවින්ම මේ මොහොතේ දී කිසිවෙකුට ජයග්‍රහණයක් අත්කර ගත නොහැක. යම් ජයග්‍රහණයක් අත්වුවද එය තාවකාලික වන අතර රටටද අයහපත්ය. ජයග්‍රහණයක් අත් කරගත යුත්තේ නම් එය ජනතා කැමැත්ත තුළින්මය. දැන් තිබෙන තත්ත්වය හමුවේ සියල්ලන්ම පරාජිතයන් වේ. ජනතාව ඉදිරිපිටදී සියලු නායකයෝ පිරිහෙති. පාර්ලිමේන්තුවේ අශෝභන හැසිරීම් හමුවේ ජනතාව තුළ මෙමක්‍රමය පිළිබඳව තිබෙන විශ්වාස බිඳ වැටී ඇත.**

> පවතින බල අර්බුදය හමුවේ රටට සිදුවෙමින් පවතින අයහපත් බලපෑම් අතරේ ආර්ථිකයට සිදුවන හානිය සුළුපටු නැත. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල අප රටේ ණය වාරිකය නතර කිරීමට යයි. ඒ අතර ශ්‍රී ලංකාවට ආර්ථික ශ්‍රේණි ලබාදෙන "මූඩීස්" ආයතනය ශ්‍රී ලංකාව ශ්‍රේණිගත කිරීම්වල පහළට දැමීමේ තීරණයේ සිටින බව කියවේ

ක්‍රමය පිළිබඳව විශ්වාස ගොඩනගා නොගතහොත් විශේෂයෙන්ම තරුණ සමාජ තුළ සෘණ අදහස් ආකල්පය මතුවිය හැකිය. එය භයානක තත්ත්වයකි. ඇතිවෙන ගැටලු ප්‍රජාතන්ත්‍රවාදීව විසඳීමට නොහැකි වීමේදී තරුණ පරපුර වෙනත් සැර විකල්ප සොයා යා හැකිය. වර්තමාන බල අරගල හමුවේ ලේ වැගිරීම් සිදුවිය හැකිය ආදී විවිධ ප්‍රකාශ දැනටමත් අපට අසන්නට ලැබේ. එවන් තත්ත්වයන් පිළිබඳව රටක් ලෙස අපට ඉතිහාසයක්ද තිබේ. 1971, 1987 තරුණ නැගිටීම් මෙන්ම උතුරු නැගෙනහිර අර්බුදයද ඊට නිදසුන්ය. අප රට කුඩා රටක් වුවද ඉතිහාසය පුරා සෑහෙන්න තරම් ලේ ගංගාවක් ගලා ගොස් ඇති බව සිහි කටයුතුය.

ජාත්‍යන්තර මැදිහත්වීම කෙරෙහි මීළඟට අවධානය යොමුකරමු. දේශපාලන වශයෙන් ආගමික නායකයන්, සමාජ ප්‍රභූන්, ජනමත නායකයින් මේ මොහොතේ ප්‍රමාණික ක්‍රියාකාරී මැදිහත්වීමක් නොකරති. නමුත් තානාපතිවරු ආදී විදෙස් බලවේග ලාංකීය දේශපාලන ගැටලුවට මැදිහත් වී සිටිති. මෙම තත්ත්වය කියවා ගතයුතු ආකාරයක් තිබේ. මෙය ලාංකික ප්‍රශ්නයකි. අපි විසින්ම විසඳගත යුත්තකි. එසේ වුවද මෑත යුගයේ පමණක් නොව පුරාතනයේද අපට ප්‍රශ්න සමඟියෙන් නිරාකරණය කරගැනීමට නොහැකි වූ විට පිටස්තරයන් ඊට මැදිහත්වී සියල්ල අවුල් කර දමා තිබේ. එයම මෙවරත් සිදුවිය හැකිය. ඒ නිසාම ආගමික නායකයන්ට වෘත්තීයවේදීන්ට මෙන්ම සමාජ නායකයන්ටද ප්‍රකාශ නිකුත් කිරීමෙන් ඔබ්බට ගොස් මීට මැදිහත් වී ගැටලුව විසඳීමට නායකත්වයක් ලබාදීමේ යුතුමක් තිබේ. මේ ප්‍රශ්නයට මැදිව සිටින්නේ මහජන නියෝජිතයන්ය. ඔවුන් අපේ නියෝජනය වෙයි. ඔවුන්ව මෙහයවීමේ හැකියාවද යුතුකමද අප සතුවෙයි. සමාජ ආගමික නායකයන් ඇතුළු මහ ජනතාව බලපෑම් සහගතව මෙම අර්බුදයට මැදිහත්වී විසඳුමක් සොයා නොගතහොත් විදෙස් මැදිහත් වීම් ප්‍රබලවීම අරුමයක් නොවේ.

**19 වන ආණ්ඩුක්‍රම සංශෝධනයට පමණක් දොස් පැවරීම පලක් නැත. 1978 ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිවරයාගේ දෙවැනි ජනරජ ආණ්ඩුව ව්‍යවස්ථාව පසුකාලයේ පෞද්ගලික අරමුණ ඉටුකර ගැනීමට ගෙන ආ සංශෝධනවලින් පිරී ඇත. එය මේ ආණ්ඩුවේ හෝ පසුගිය ආණ්ඩුවල වරදකට වඩා අප දේශපාලන සංස්කෘතියටම ඇතුළත්ව ඇති ව්‍යවස්ථාව අවස්ථාවාදී ලෙස භාවිතා කිරීමේ පුරුද්දේ ගැටලුවකි. එනිසා සමාජ තුළත් ව්‍යවස්ථාව පිළිබඳව විශ්වාසනීය බවක් නොමැත. ජාත්‍යන්තරටද මෙය පහදාදීම ඉතා අපහසුය. මන්ද ව්‍යවස්ථා රාමුව පිළිබඳව ඔවුන්ට ඇති දැක්ම හා ආකල්පය අප රටට වඩා වෙනස් වෙයි. ඇමරිකා එක්සත් ජනපද, යුරෝපය, ඉන්දියාව ඇතුළු රටවල් ව්‍යවස්ථා රාමුව දකින්නේ වෙනස් ආකාරයකටය.**

අපට ඇත්තේ මිශ්‍ර ක්‍රමයකි. පාර්ලිමේන්තුට පමණක් නොව ජනාධිපතිවරයාටද ජනවරමක් ඇත. 19 වැනි ව්‍යවස්ථා සංශෝධනය හරහා ජනාධිපතිවරයාගේ බලතල අඩුකිරීමට ගිය විටදී පවා ඇතැම් බලතල සංශෝධනයට ශ්‍රේෂ්ඨාධිකරණය ජනමත විචාරණයක අවශ්‍යතාව පෙන්වා දෙනු ලැබීය. ඒ අනුව මෙම සට්ටනයට මුල් වූ පාර්ලිමේන්තුවට සහ ජනාධිපතිවරයාට ජන බලයක් සහිත මෙම දෙමුහුන් ක්‍රමයේ දී බලය වඩා වැඩි ජනාධිපතිවරයාටද පාර්ලිමේන්තුවටද යන්න තෝරා බේරාගැනීම පහසු නොවේ. එය සෘජුව මෙම අර්බුදයට බලපා තිබේ. ඒ අනුව පාර්ලිමේන්තු මැතිවරණයකට යාම මේ අර්බුදය නිමාකර ගැනීමට ඇති විකල්පය බව නැවතත් අවධාරණය වෙයි.

**පවතින බල අර්බුදය හමුවේ රටට සිදුවෙමින් පවතින අයහපත් බලපෑම් අතරේ ආර්ථිකයට සිදුවන හානිය සුළුපටු නැත. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල අප රටේ ණය වාරිකය නතර කිරීමට යයි. ඒ අතර ශ්‍රී ලංකාවට ආර්ථික ශ්‍රේණි ලබාදෙන "මූඩීස්" ආයතනය ශ්‍රී ලංකාව ශ්‍රේණිගත කිරීම්වල පහළට දැමීමේ තීරණයේ සිටින බව කියවේ. එසේ අප අවදානම් සහගත රටක් වුවහොත් ණය ගැනීමේ දී අප විසින් ගෙවිය යුතු පොලිය වැඩිවෙයි. රාජ්‍යය හා පෞද්ගලික අංශයේ ආයතනවල තීන්දු තීරණය ගැනීමට නොහැකි තත්ත්වයක්ද උදාවී තිබේ. මෙම අර්බුදය මාසයක කාලයක් පුරා රට තුළ ඇති කර ඇත්තේ අස්ථාවර තත්ත්වයකි.**

ඉතිහාසයේ පටන් අප විවිධ අර්බුදයන්ට අභියෝගයන්ට මුහුණදී තිබේ. එහෙත් මෑත ඉතිහාසයේ කවර අභියෝග හමුවේ වුවද ආණ්ඩු පාලනයන් සිය පාලනය පවත්වාගෙන ගොස් ඇත. මේ පාලන යාන්ත්‍රණය කඩා වැටුණු පළමු අවස්ථාවයි. තිස් වසරක යුද්ධය හමුවේ ද එවන් ගැටලුවක් පැන නොනැගිණි. එක්දහස් හයසිය ගණන්වලදී බ්‍රිතාන්‍යයේ රජු හා පාර්ලිමේන්තු අතර අර්බුදයක් නිර්මාණය විය. එය කෙසේ හෝ වේවා බ්‍රිතාන්‍යය අද දක්වා තම ගමන පැමිණ ඇත්තේ සිය සම්ප්‍රදාය හරහා ව්‍යවස්ථාවක් පවා නැතිවය. නමුත් ලංකා දේශපාලන තුළ එවන් සම්ප්‍රදායන් නොමැත. පාර්ලිමේන්තු තුළ ඇතිවන අර්බුදයන්ට හේතුවද නිසි සම්ප්‍රදායක් අපට නොවීමයි. මෙරට පාලකයන් ඊට වගකිව යුතුවේ. සම්ප්‍රදායක් ගොඩනගනු වෙනුවට ඔවුහු සිය වුවමනා එපාකම් අනුව ව්‍යවස්ථාව වෙනස් කරමින් සිටිති.

වර්තමාන අර්බුදය විසඳීමට ආගමික නායකයන්, වෘත්තීයවේදීන්, බුද්ධිමතුන් මෙන්ම පෞද්ගලික අංශයද මැදිහත්විය යුතුය. මෙය දේශපාලනඥයන්ගේ වැඩක් යැයි කියා රූපවාහිනී පුවත් බලා පසෙකට වී සිටීම ඵලක් නැත. තවද පටු ලෙස ව්‍යවස්ථාව මට්ටමින් පමණක් මේ පිළිබඳව සලකා බැලීමද අර්ථවිරහිතය. ව්‍යවස්ථාවද මිනිස්සු විසින් සාදන ලද්දකි. එය අපට නොගැළපේ නම් අපට ගැළපෙන ලෙස සකසාගත යුතුය.

■ චමිඳු නිසල්